**BIOLOGICALS BY BAYER**

*The power of nature. Empowered by science.*



BAYER

# ෆ්ලිපර්

කාබොක්සිලික් අම්ල (C14-C20)
පොටෑසියම් ලවණ 479.8 ග්‍රෑ./ලී. ඊ.ඩබ්.

## වම්බටු, ඕකිඩ්, ජර්බෙරා, කටරොළු වගාවල සුදු මැස්සන්, පැල මැක්කන්, කූඩිත්තන්, පිටි මකුණන්, කොරපොතු කෘමීන් යන යුෂ උරාබොන කෘමීන් සහ මයිටාවන් අර්තාපල් වගාවේ කූඩිත්තන් පාලනයට







**ශාකමය සම්භවයක් සහිත නවතම ජෛව පළිබෝධනාශකය**

# ෆ්ලිපර්

කාබොක්සිලික් අම්ල (C14-C20)
පොටෑසියම් ලවණ 479.8 ග්‍රෑ./ලී. ඊ.ඩබ්.

ලංකා LANKA

ROP/LS/10072023

agrochem@ceypetco.gov.lk

කාබනික වගාවට
**පහසු මගක්**

Ceypetco Agro

ලියාපදිංචිය :
**සිපෙට්කෝ කෘෂිරසායන අංශය**
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, කොලොන්නාව.
දුරකථන : 011 5 666815
ෆැක්ස් : 011 2 572316

**භාවිතයට පෙර ලේබලයේ සඳහන් සියලු උපදෙස් ඉතා හොඳින් කියවා භාවිතයේදී එම උපදෙස් පිළිපදින්න. සෑමවිටම ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම අනුගමනය කරන්න.**

## ISO 9001 - 2015, ISO 14001 - 2015 සහ ISO 45001:2018 ජාත්‍යන්තර තත්ව සහතික වලින් පිදුම්ලත් සිපෙට්කෝ කෘෂි අංශයේ කෘෂි පළිබෝධනාශක භාවිතා කර සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න

**වැදගත් :** මෙම නිෂ්පාදනය නිවැරදිව සහ ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා ලේබලයේ සඳහන් සියලු උපදෙස් ඉතා හොඳින් අනුගමනය කරන්න.

- ස්පර්ශ ක්‍රියාකාරීත්වයක් සහිත ෆ්ලිපර් ජෛව කෘමි/මයිටා නාශකය පළිබෝධකයාගේ සිරුරේ තැවරීම මගින් පළිබෝධකයන් පාලනය කරයි.
- පළිබෝධ කෘමීන්ගේ සහ මයිටාවන්ගේ සියළු වර්ධක අවධි එනම් සුහුඹුලන්, ශිෂුවන් සහ ඇතැම් අවස්ථාවලදී බිත්තර යන අවස්ථාවන් වලට එරෙහිව ක්‍රියාකරයි.

## භාවිතය සඳහා උපදෙස්

### ඉසින මිශ්‍රණය සකස් කිරීම

ෆ්ලිපර් යෙදීමට පෙර ඉසින යන්ත්‍රය ඉතා හොඳින් පිරිසිදු කර නිවැරදිව ක්‍රමාංකනය කර ගන්න. ෆ්ලිපර් නිර්දේශිත ප්‍රමාණය ටැංකියට යොදන්න. පිරිසිදු ජලයෙන් ටැංකිය නියමිත ප්‍රමාණයට පුරවාගන්න. ෆ්ලිපර් ජලය සමග පහසුවෙන් මිශ්‍රවන ලෙස නිෂ්පාදනය කර ඇති නිසා මිශ්‍රණය සකස් කිරීමේදී වැඩිපුර කැලතීම අවශ්‍ය නොවේ. මිශ්‍රණයේ පෙණ ඇතිවීම වළක්වා ගැනීම සඳහා අවම ලෙස කැළතීම සිදු කරන්න.

මිශ්‍රණය සකස් කිරීමේදී කාබනේට හෝ ලෝහ අයන සාන්ද්‍රණය වැඩි කඨින ජලය භාවිතය සුදුසු නොවේ. කඨින ජලය භාවිතා කිරීමට සිදුවන අවස්ථාවලදී ෆ්ලිපර් මිශ්‍රකිරීමට පෙර මෘදුකාරක සංයෝගයක් එක් කිරීම මගින් ෆ්ලිපර් වල උපරිම සාර්ථකත්වය ලබාගත හැකිය. මිශ්‍රණය සකස් කල වහාම වගාවට යොදන්න. යෙදීමෙන් පසුව ඉසින යන්ත්‍රය හොඳින් පිරිසිදු කරගන්න.

| භාවිතය සඳහා නිර්දේශ | | භාවිතය සඳහා උපදෙස් | | |
|---|---|---|---|---|
| බෝගය | මර්දනය වන පළිබෝධකයන් | මිශ්‍රණය | යෙදිය යුතු ප්‍රමාණය | මිශ්‍රණය යෙදිය යුතු ප්‍රමාණය |
| වම්බටු | සුදු මැස්සන්, පැළ මැක්කන්, කූඩිත්තන්, පිටි මකුණන්, කොරපොතු කෘමියන් යන යුෂ උරාබොන කෘමියන් සහ මයිටාවන් | 1% ක ද්‍රාවණය<br>ෆ්ලිපර් මි.ලී. 160 ක් ජලය ලීටර් 16 ක දියකර සාදාගන්නා ද්‍රාවණය | හෙක්ටයාර 1 කට ෆ්ලිපර් ලීටර් 3.2 - 4<br>(අක්කර 1 කට ලීටර් 1.28 - 1.6) | හෙක්ටයාර 1 කට මිශ්‍රණය ලීටර් 320 - 400<br>(අක්කර 1 කට ලීටර් 128 - 160) |
| ඕකිඩ්<br>ජර්බරා<br>කටරොළු | | | | |
| අර්තාපල් | කූඩිත්තන් | | | |
| ශේෂ ක්‍රියාකාරීත්වයක් නොමැත. (පෙර අස්වනු කාලය : දින 0 කි) | | | | |

### ෆ්ලිපර් යොදන ආකාරය

**ෆ්ලිපර් ස්පර්ශ ක්‍රියාකාරීත්වයක් සහිත නිසා වගාවේ දක්නට ලැබෙන පළිබෝධ කෘමි සහ මයිටාවන්ගේ (බිත්තර, ශිශූ සහ සුහුඹුලන්) සිරුරේ හොඳින් තැවරෙන ලෙස යෙදීම අනිවාර්ය වේ.** පළිබෝධකයින් හෝ පළිබෝධ හානිය දක්නට ලැබෙන මුල්ම අවස්ථාවේදීම ෆ්ලිපර් යෙදීම ආරම්භ කරන්න. පළිබෝධකයන් සහ ධාරක ශාකය හොඳින් තෙමීයන පරිදි නිර්දේශිත ජල ප්‍රමාණය සමග මිශ්‍රකර පත්‍ර හොඳින් තෙමීයන සේ යෙදිය යුතුය. පත්‍රවල ඉහළ කොටසේ මෙන්ම යටි පැත්තේ ද හොඳින් තැවරිය යුතුය. පළමු යෙදීමෙන් පසුව අවශ්‍යතාව අනුව දින 7 කට පසුව නැවත ෆ්ලිපර් භාවිතා කරන්න.

## ෆ්ලිපර්

- /// යුරෝපා සංගමයේ සහතිකලත් ශාකමය සම්භවයක් සහිත කාබනික කෘමිනාශකයකි. ක්‍රියාකාරී සංයෝගය ආහාර ශ්‍රේණි ද්‍රව්‍ය (Food Grade Material) වර්ගීකරණයට අයත් සංයෝගයක් ලෙස ලැයිස්තු ගත කර ඇත.
- /// නිර්දේශිත කෘමි හා මයිටා පළිබෝධකයන්ගේ තැවරීම මගින් සියළු අවධි (බිත්තර, ශිෂු සහ සුහුඹුලන්) පාලනය කරයි.
- /// නිර්දේශිත මාත්‍රාවෙන් යෙදීමේදී මී මැස්සන්, පරාගනකාරක කෘමීන් සහ අනෙකුත් හිතකර කෘමීන් / හිතකර මයිටාවන් හට හානිදායක නොවේ.
- /// හඳුනාගත හැකි අවශේෂ (residues) නොමැතිවීම නිසා යුරෝපා සංගමය විසින් උපරිම අවශේෂ සීමා (MRL) පරීක්ෂණ වලින් නිදහස් කර ඇත.
- /// ශේෂ ක්‍රියාකාරීත්වයක් නොමැති නිසා පෙර අස්වනු කාලය ඉතා කෙටිය (දින 0).
- /// ලේබලයේ සඳහන් උපදෙස් සහ නිර්දේශ අනුව යෙදීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිය.
- /// ලේබලයේ උපදෙස් අනුව යෙදීමෙන් පරිසරයට සහ යොදන්නාට සිදුවන හානිය අවම වේ.

FLiPPER™ is the Registered Trademark of Alpha BioPesticides Ltd, UK

| Tye | Product Name | Pack Size | Country |
|---|---|---|---|
| LEAFLET | FLiPPER | | Sri Lanka |

| Date | Dimension | Color | Drawing No. | Coding |
|---|---|---|---|---|
| 14.07.2023 | 297 x 210 | CMYK | CPC-LF-01 | |